**නිවේදනයයි**

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුවී ඇති හැටන් සහ කොත්මලේ අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින හැටන් සහ කොත්මලේ අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:-**

01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.

02. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් I වන හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ වරදකට පූර්වාසන්න වසර 5ක දඬුවම් නොලැබූ අයෙකු හා කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හා එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු හෝ නොවිය යුතුයි.

03. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

05. මධ්‍යම පළාතේ දැනට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ඉල්ලුම් කරන්නේ නම්, අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට ඔහු/ඇය දැනට සේවයේ නියුතු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්ව එම තනතුරේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :-**

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමය :-**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම මගිනි (අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත).

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

අයදුම්පත් **www.cmcp.gov.lk** යන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැක. සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.06.16 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුවී ඇති හැටන් සහ කොත්මලේ අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම."** යනුවෙන් සඳහන් කළ යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

M. P. ~

මධුපානි පියසේන
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත